(18)

ප්‍රධාන ලේකම් කාර්යාලය - උතුරු මැද පළාත - අනුරාධපුර
பிரதான செயலாளர் அலுவலகம் - வடமத்திய மாகாணம் - அநுராதபுரம்
OFFICE OF THE CHIEF SECRETARY - NORTH CENTRAL PROVINCE - ANURADHAPURA

උතුරු මැද පළාත් සභා සංකීර්ණය, 4 වන මහල B, හරිශ්චන්ද්‍ර මාවත, අනුරාධපුරය.
வட மத்திய மாகாண சபை கட்டிடத் தொகுதி, 4ம்மாடி "B" ஹரிச் சந்திரா வீதி, மாவத்த, அநுராதபுரம்.
North Central Provincial Council Complex 4th Floor B, Harischandra Mawatha, Anuradhapura.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary

දුරකථනය / தொ.பே.இல / Tele: 025-2222695
විමසීම් / விசாரணை / Inquiries: 025-2235790
Fax: 025-2224914
E-mail: csncpc@gmail.com

මගේ අංකය / எனது இல. / My No.: NCP/CS/ED/11/5/3
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2021.11.05

**ප්‍රධාන ලේකම් චක්‍රලේඛ 2021/1**

උතුරු මැද පළාතේ සියළුම ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත

<u>උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ට එරෙහිව පවත්වන විනය කටයුතු සම්බන්ධයෙන් වන විධිවිධාන ක්‍රියාත්මක කිරීම.</u>

ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ සඳහන් නියමයන්ට හා උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල පවරමින් නිකුත් කර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 1/2019 හි බලතල සීමාවන්ට යටත්ව, උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් හා සේවකයින් සම්බන්ධ විනය කටයුතු ප්‍රමාදයකින් තොරව පවත්වාගෙන යාම සඳහා මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන 2021.11.01 දින සිට ක්‍රියාත්මක කළ යුතුය.

1. යම් වංචාවක්, දූෂණයක් හෝ විෂමාචාරයක් පිළිබඳව අනාවරණය වූ වහාම ඒ සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් කවුරුන් ද යන්න තහවුරු කර ගැනීම සඳහා ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 13 වගන්තිය අනුව කටයුතු කිරීම.

2. එලෙස පවත්වනු ලබන මූලික විමර්ශනය අනුව විධිමත් විනය කාර්ය පටිපාටිය අනුගමනය කිරීමට තරම් බරපතළ විෂමාචාරයක් නොවන අවස්ථාවකදී එවැනි පුද්ගලයින් සම්බන්ධයෙන් එකී පරිච්ඡේදයේ 25 වගන්තිය අනුව ලඝු විනය කාර්ය පටිපාටිය යටතේ කටයුතු කිරීම.

3. චූදිත නිලධාරියෙකුට චෝදනා පත්‍රය ලබාදීමෙන් පසු එම සියලුම චෝදනාවලට වරදකරු බවට පිළිගෙන පිළිතුරු ලබාදී ඇත්නම්, චූදිත නිලධාරියාට එරෙහිව ඇති චෝදනා වල ස්වභාවය සැලකිල්ලට ගෙන ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයෙහි 15:6 වගන්තියේ විධිවිධාන අනුව විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමෙන් තොරව සුදුසු දඬුවම් නියම කිරීමට හැකියාව ඇත්නම්. විනය බලධාරියා ඒ අනුව කටයුතු කිරීම.

4. සෑම අමාත්‍යාංශ ලේකම්වරයෙකුම තම අමාත්‍යාංශ හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු හා ආයතනවල පවතින විනය කටයුතු සම්බන්ධයෙන් දත්ත පද්ධතියක් යාවත්කාලීනව පවත්වාගෙන යා යුතු අතර සෑම මාස තුනකටම වරක් ඒ පිළිබඳ වාර්තාවක් මේ සමඟ ඇති (ඇමුණුම 01) ආකෘතිය මගින් මා වෙත වාර්තා කිරීමට කටයුතු කිරීම.

5. සෑම අමාත්‍යාංශයක් හා දෙපාර්තමේන්තුවක් සඳහාම විනය කටයුතු සම්බන්ධයෙන් වගකිවයුතු මාණ්ඩලික නිලධාරියෙකු විනය කටයුතු සම්බන්ධීකරන නිලධාරි ලෙසපත් කළ යුතු අතර, එම නිලධාරියාගේ නම, තනතුර, දුරකථන අංකය හා ලිපිනය සතියක් ඇතුලත මා වෙත දන්වා එවිය යුතු අතර, අදාළ නිලධාරියා ස්ථාන මාරු වූ විට හෝ විශ්‍රාම ගිය අවස්ථාවක. ඒ වෙනුවෙන් වෙනත් නිලධාරියකු පත් කර ඒ බව මා වෙත දැන්වීමට කටයුතු කිරීම.

6. යම් සිද්ධියක් සැලවූ වහාම විනය බලධාරීන් විසින් චූදිත නිලධාරියාගේ රාජකාරි වැඩ තහනම් කිරීමට කටයුතු නොකළ යුතු අතර, ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ 31 වගන්තියේ සඳහන් විධිවිධාන අනුව එම සිද්ධියේ බරපතලකම හා චූදිත නිලධාරියා සේවයේ සිටීම පරීක්ෂණ කටයුතුවලට එක එල්ලේම බාධාවක් ඇති වේ යැයි හැඟේ නම් පමණක් රාජකාරි වැඩ තහනම් කළ යුතු අතර, නොඑසේ නම් අදාළ නිලධාරියා පරීක්ෂණයකට යටත් ව වෙනත් ස්ථානයකට මාරු කිරීමට කටයුතු කිරීම.

7. විධිමත් විනය පරීක්ෂණ සඳහා ඒක පුද්ගල විනිශ්චය සභා පත් කිරීමේ දී උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලියාපදිංචි, උතුරුමැද පළාතේ පදිංචි රජයේ නිලධාරීන් හා විශ්‍රාමික නිලධාරීන් හැකි සෑම විටම විනිශ්චය සභා සඳහා පත් කිරීමට විනය බලධාරීන් කටයුතු කළ යුතු අතර, යම් විශේෂිත අවස්ථාවකදී හෝ සුදුසු නිලධාරියකු නොමැති අවස්ථාවකදී පමණක් පළාතෙන් පිට පදිංචි නිලධාරීන් විනිශ්චය සභා සඳහා පත් කිරීමට කටයුතු කළ යුතුය. එමගින් විනය කටයුතු ප්‍රමාද වීම හා ඒ සඳහා පළාත් සභාවට දැරීමට සිදුවන පිරිවැය අවම කරගත හැකි වනු ඇත.

8. මූලික විමර්ශන හා විධිමත් විනය පරීක්ෂණ පැවැත්වීම සඳහා පත් කර ඇති නිලධාරීන්ට චූදිත නිලධාරියාගෙන් හෝ වෙනත් බාහිර පාර්ශවයකින් යම් බාධා කිරීමක් හෝ තර්ජනයක් ඇති වේ නම් අදාල අමාත්‍යාංශ ලේකම් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් වහාම ඒ සම්බන්ධයෙන් තම පෞද්ගලික අවධානය යොමුකර අවශ්‍ය පියවර ගත යුතු අතර, බාධාවකින් තොරව විනය පරීක්ෂණ කටයුතු පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය වටපිටාව සකස් කර දීමට කටයුතු කිරීම.

9. මූලික විමර්ශන හා විධිමත් විනය පරීක්ෂණ පැවැත්වීම සඳහා පත් කර ඇති නිලධාරීන්ට අවශ්‍ය ස්ථානීය පහසුකම් හා අනෙකුත් පහසුකම් සලසා දීම සෑම ආයතන ප්‍රධානියෙකු ගේ වගකීම වන අතර, එම කටයුතු තම ආයතනයේ සිටින විනය කටයුතු සම්බන්ධීකරණ නිලධාරියා වෙත පැවරීමට ආයතන ප්‍රධානීන් කටයුතු කිරීම.

10. මූලික විමර්ශනයක් හෝ විධිමත් විනය පරීක්ෂණයක් අවසන් කර වාර්තා හා අදාල ලේඛන නිසි පරිදි භාර දී ඇත්නම්, විමර්ශන නිලධාරියාට හෝ පරීක්ෂණ මණ්ඩලයට ගෙවිය යුතු දීමනා දින 14ක් ඇතුළත ගෙවීමට සියලුම ආයතන ප්‍රධානීන් කටයුතු කිරීම.

11. විශ්‍රාම ගැනීමට ආසන්නයේ සිටින නිලධාරියෙකුට එරෙහිව ඇති විනය කටයුතු සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කර පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් කළ යුතු අතර, එවැනි නිලධාරියෙකුට එරෙහිව පවතින පරීක්ෂණ සම්බන්ධයෙන් හැකි සෑම විටම ඉහත 2 හා 3 වගන්තිවල සඳහන් විධිවිධාන අනුව කටයුතු කිරීමට විනය බලධාරීන් කටයුතු කල යුතුය. චූදිත නිලධාරියා අනිවාර්ය විශ්‍රාම ගැනීමේ වයසට එළැඹීමට ප්‍රථම එලෙස කටයුතු කර පරීක්ෂණ කටයුතු අවසන් කිරීමට නොහැකි වන අවස්ථාවලදී පමණක් අදාල නිලධාරියා විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2:12 වගන්තිය යටතේ විශ්‍රාම ගන්වා කඩිනමින් පරීක්ෂණ කටයුතු අවසන් කිරීම.

එල්.ජේ.එම්.ජී.චන්ද්‍රසිරි බණ්ඩාර,
ප්‍රධාන ලේකම්,
උතුරු මැද පළාත.